චක්‍රලේඛ අංකය : 07/2016


My No: RG/MBD/01/2012

Your No:

Telephone Nos.: 2889488, 2889489

Fax No: 2889491

E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk


# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகத் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE


Web site: www.rgd.gov.lk

P. O. Box No. 565

234 A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


Date: 2016.08.16

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,
සියළුම උප්පැන්න මරණ සහ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්

## අවිවාහක මවට උපන් දරුවාගේ උපත ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකාවේ ළමා පරපුරේ ඉදිරි අනාගතය සුරක්ෂිත කිරීමේ අරමුණින් හඳුන්වා දී ඇති "දරුවන් සුරකිමු" ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස පැවරී ඇති එක් යෝජනාවක් වන්නේ, මව්පියන් අවිවාහක අවස්ථාවක, දරුවෙකුගේ උපත ලියාපදිංචි කිරීමේදී පියාගේ නම "නොදනී" වෙනුවට මව සහ පියා යන දෙදෙනාගේම කැමැත්ත මත පියාගේ නම උප්පැන්න සහතිකයට ඇතුළත් කිරීමේ අවස්ථාව ලබාදීමයි.

02 උප්පැන්න මරණ පනතේ 21 වගන්තියෙන්, නීත්‍යානුකූල විවාහයක් නොමැති යුවලකට උපදින දරුවකුගේ උපත පියාගේ තොරතුරුද ඇතුළත් කර ලියාපදිංචි කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. දරු උපත් ලියාපදිංචි කිරීම සඳහා දෙමාපියන්ගෙ විවාහ සහතිකය අනිවාර්ය සාධකයක් වශයෙන් දැක්වීම නිසා, මෙවැනි දරුවන්ගේ උපත් ලියාපදිංචි කිරිම මග හැරී යාමට හෝ පියාගේ තොරතුරු රහිතව ලියාපදිංචි කිරීමට හෝ ඉඩ ඇත. එබැවින්, අවිවාහක මවකට උපන් දරුවකුගේ උපතක් ලියාපදිංචි කිරීමට, ඉල්ලීමක් ඉදිරිපත් වන අවස්ථාවකදී, මව සමග පියාද මේ සඳහා කැඳවා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු වේ. දෙමාපියන් දෙදෙනාම මේ සඳහා ඉදිරිපත් වීමෙන් දරුවාගේ උප්පැන්නයට පියාගේ තොරතුරු ඇතුළත් කර ලියාපදිංචි කල හැකි බවට, අනිවාර්යෙන්ම දෙමාපියන් දැනුවත් කළ යුතු වේ. ඒ අනුව, අදාල ප්‍රකාශ පත්‍රයට හෝ උප්පැන්න ලේඛනයේ 10 තීරයට මව සහ පියාගේ අත්සන් ලබාගෙන;

- 4 තීරයට පියාගේ තොරතුරු ඇතුළත් කර,
- 6 තීරයේ "නැත" වශයෙන් යොදා,
- 7 තීරයේ මව්පස මුත්තාගේ තොරතුරු සඳහන් කර,
- 8 තීරයේ "මව ශ්‍රී ලංකාවේ උපන්නියකි" වශයෙන් හෝ සුදුසු ලෙස මව් පස මී මුත්තාගේ තොරතුරු සඳහන් කර,
- 9 තීරයේ දෙමාපිය දෙදෙනාගේම නම් සඳහන් කර,

උපත නිසි පරිදි ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස කරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:-

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය -කරු, ඔබේ අංක PS/DSP/COMIII/CHLD අනුව දැ.ගැ.ස.
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යංශය - කරු, ඔබේ අංක HF/අනි.ලේ/විවිධ අනුව දැ.ගැ.ස.
3. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.